# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/4 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2019.07. 11 |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 03-2019**

දකුණු පළාතේ සියළුම

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා

ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී " ගිණුම යටතේ අය විය යුතු ණය ශේෂයන්</u>

01.උක්ත කරුණ සම්බන්ධව මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2019.06.27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 05/2019 දරණ චක්‍රලේඛය හා බැදේ.එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

02.මෙම චක්‍රලේඛයේ පැහැදිලි කර ඇති උපදෙස් පිළිබඳව විශේෂ අවධානය යොමු කර, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් " බී " ගිණුම මඟින් ලබා දුන් ණය මුදල් ආපසු අය කර ගැනීමේ ගැටළු හා රජයේ ආයතනවල අත්තිකාරම් බී ගිණුමේ දීර්ඝ කාලීනව පවතින හිඟ ශේෂ සම්බන්ධ ගැටළු මග හරවා ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

03.ඒ අනුව මෙම චක්‍රලේඛයේ නිකුත් කර ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙසටත් ,මෙම චක්‍රලේඛය පිළිබඳව ඔබ යටතේ ඇති ආයතන දැනුවත් කරන ලෙසටත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :

01. සහකාර විගණකාධිපති - දකුණු පළාත - දැ.ගැ.ස.
02. දකුණු පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.ස.
03. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ - දැ.ගැ.ස.
04. ප්‍රධාන ගණකාධිකාරී - දැ.ගැ.ස.

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: PFD/RED/CIR/2019/04
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019.06.27

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 05/2019

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් හා
පළාත් පාලන ආයතන ප්‍රධානින් වෙත

**<u>රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුම යටතේ අය වියයුතු ණය ශේෂයන්</u>**

රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුම මඟින් ලබා දුන් ණය මුදල් ආපසු අයකර ගැනීමේ ගැටළු හේතුවෙන් මුදල් රෙගුලාසි සංග්‍රහයේ 113 වන රෙගුලාසිය යටතේ එම මුදල් අත්හැරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත නිරන්තරයෙන් ඉල්ලීම් ඉදිරිපත් වන අතර රජයේ ආයතනවල අත්තිකාරම් "බී" ගිණුමේ හිඟ ශේෂ දීර්ඝ කාලයක් තිස්සේ පැවතීම අභ්‍යන්තර විගණන හා රජයේ විගණන අංශ විසින් විමසීම් කරන පොදු කාරණාවක් බවට පත් වී ඇත.

02. මු.රෙ 501 (ඇ) අනුව රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුම මඟින් ලබා දුන් ණය මුදල් වලින් පාඩු සිදුවීමක් රජය අපේක්ෂා කරනු නොලබන බැවින් එකී ණය මුදල් ගෙවීම සඳහා අධිකාරි බලය දීමේ දී, නියම කර ඇති කොන්දේසි ප්‍රකාරව ආපසු අයකර ගත යුතුය. රාජ්‍ය නිලධාරින්ට අවම පොළී ප්‍රතිශතයක් යටතේ ලබාදෙන ණය මුදල් එකී ණය ලබා ගත් නිලධාරීන් ස්ථාන මාරුවීම, ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම යෑම, මියයෑම, සේවය අතහැරයෑම, සේවය අත්හිටුවීම යනාදී හේතූන් මත නිරන්තරයෙන් කපා හැරීමට කරන ඉල්ලීම් බොහොමයක්, එකී ඉල්ලීම් කරන ආයතනවල පවත්නා මූල්‍ය පාලන ක්‍රමවේදයේ දුර්වලතාවයන් නිසා මතු වී ඇති බව පෙන්වා දෙමි.

03. එබැවින් රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුම යටතේ ලබා දී ඇති ණය මුදල් අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ජේදය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් හා 2004.10.11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛ විධිවිධාන අනුව පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස අදාල නිලධාරින් දැනුවත් කිරීමට වග බලා ගත යුතු ය.

**(අ) ස්ථාන මාරු වීම් යන /එන නිලධාරින්ට අදාල ණය ශේෂ**

ස්ථාන මාරුවීම් යන /එන නිලධාරින්ට අදාල නිරවුල් නොවූ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1:6, 1:7 හා 6:3 වගන්ති හා 2004.10.11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව කටයුතු කලයුතු වේ. එම චක්‍රලේඛයෙහි 1.1.7 ඡේදය අනුව "නිලධාරියෙක් මාරුවී පැමිණ මාස දෙකක් ගත වීමෙන් පසු හෝ නිලධාරියෙක් මාරුවී ගොස් මාස තුනක් ගත වීමෙන් පසු දෙපාර්තමේන්තු අතර නිරවුල් නොවූ ණය ශේෂ නොපෙන්වීමට වගබලා ගත යුතු ය" යන්න සඳහන් වේ. නිලධාරීන් නව සේවාස්ථානයේ වැඩ බාරගැනීම සඳහා කලින් සේවා ස්ථානයෙන් නිදහස් කල වහාම මෙම හිඟ ණය මුදල් පිළිබඳ විස්තර නව සේවා ස්ථානය වෙත දැනුම් දී ණය ශේෂයන් නිරවුල් කර ගැනීමට අදාල ආයතනයේ පාලන සහ ගිණුම් අංශයන්හි එම විෂයභාර මාණ්ඩලික නිලධාරීන් විසින් වගබලාගත යුතු ය.

**(ආ) ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින හා මියගොස් ඇති සේවකයින්ගේ ණය ශේෂ**

ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින හා මියගොස් ඇති සේවකයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයෙහි XXIV පරිච්ඡේදයේ 4:2:2, 4:2:4, 4:2:5, 4:5, 4:6 හා 6:3 වගන්තිය අනුව කටයුතු කළ යුතු ය.

**(ඇ) විදේශගතවූ නිලධාරීන්ට අදාල ණය ශේෂ**

විදේශගත වූ නිලධාරින්ගෙන් අය විය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3:18 ,4:5, 4:6 හා 6:3 අනුව කටයුතු කළ යුතු ය.

**(ඈ) ණය මුදල ගෙවා අවසන් වීමට ප්‍රථම සේවයෙන් මුදා හරින ලද සේවකයින්ට අදාල ණය ශේෂ**

ණය මුදල ගෙවා අවසන් වීමට ප්‍රථම සේවයෙන් මුදා හරින ලද සේවකයින් සඳහා ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයෙහි 4:8 හා 6:3 උපවගන්ති අනුව කටයුතු කළ යුතු ය.

**(ඉ) කල්ගත වූ ණය ශේෂ**

ඉහත උපදෙස් පරිදි අදාල අවස්ථාවලදී නිසි පරිදි කටයුතු නොකිරීමෙන් කල්ගත වූ ණය ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

i. සේවය අතහැර යෑම,වැඩ තහනම් කිරීම යනාදි හේතූන් මත ණය අයකර ගත නොහැකි නිලධාරින් නැවත සේවයේ පිහිටුවා ඇතිද , යන්න ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් විමසා තහවුරු කරගැනීමෙන් පසු වර්තමාන සේවා ස්ථානයේ ප්‍රධානියා මඟින් එකී නිලධාරින්ගේ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීම

ii. ඉහත (i) හි පරිදි නැවත සේවයේ පිහිටුවා නොමැති අවස්ථාවල එම සේවකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංක මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර පදිංචිය පිළිබඳ විස්තර විමසා ප්‍රාදේශීය ලේකම් මගින් එම නිලධාරින්ගේ වත්කම් පිළිබඳ තහවුරුවක් ලබාගැනීමෙන් අනතුරුව නීතිපති මගින් ණය මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම

04. ඉහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව ද අයකර ගත නොහැකි ණය ශේෂ වේ නම් අදාල ක්‍රියාමාර්ග ගත් බවට සහතික කළ හැකි ලේඛන ද සමග හිඟ ණය ශේෂ අත්හැරීම සඳහා මු.රෙ. 113 යටතේ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්/ භාණ්ඩාගාරයේ ලේකම් වෙත යොමු කිරීම සඳහා වන ඉල්ලීමක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

05. සියළු අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් මෙම චක්‍රලේඛයේ ඉහතින් පැහැදිලි කර ඇති උපදෙස් පිළිබඳව විශේෂ අවධානය යොමු කර රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුම මගින් ලබා දුන් ණය මුදල් ආපසු අයකර ගැනීමේ ගැටළු හා රජයේ ආයතනවල අත්තිකාරම් බී ගිණුමේ දීර්ඝ කාලීනව පවතින හිඟ ශේෂ සම්බන්ධ ගැටළු මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බව දන්වා සිටිමි.

ඒ.ආර්. දේශප්‍රිය
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති